

# 15
# අල්කුර්ආනය පහළ වීම

අදට සියවස් 15කට පෙර අරාබි දේශය පුරා ම නූගත්කම නමැති අන්ධකාරය පැතිරී තිබුණි. පාපී ක්‍රියාවන්ගේ ප්‍රතිමූර්තියක් ලෙස එහි වැසියන් ජීවත් විය. මෙම කාල පරිච්ඡේදය තුළ ඔවුන් අතර මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඉපදුණාහ. සත්ගුණවත් කෙනකු ලෙස හැදී වැඩුණේ ය. එම වැසියන්ගේ අඥානකම දක දැඩි ලෙස කනගාටුවට පත් වූවෝ ය. එතුමාණෝ ව්‍යාකුලත්වයෙන් මහා පාපී ක්‍රියාවන්ගෙන් ඔවුන් මුදවා ගන්නේ කෙසේ දැයි මග සොයමින් සිටියහ. එතුමා තරුණ වියට පැමිණ සමාජයේ වගකීම් දැරීමේ තත්ත්වයට පැමිණි විට සමාජය පිළිබඳ උනන්දුව හා කනගාටුව තව තවත් වැඩි විය. සමාජ ප්‍රතිසංස්කරණය ගැන තව දුරටත් සිතන්නට විය.

මක්කාවේ සිට සැතපුම් තුනක් පමණ දුරින් හිරා නම් ගුහාවක් තිබුණේ ය. අධික වශයෙන් වැඩි ම වේලාවක් තනිව ම එහි ගොස් තම සමාජයේ තත්ත්වය ගැනත් ඔවුන්ගේ විමුක්තිය පිළිබඳවත් එතුමාණෝ සිතන්නට වූවෝ ය; කෑමට - බීමට අවශ්‍ය දේවල් ද රැගෙන ගියහ. ඒවා අවසන් වූ විට එතුමා ම නිවසට පැමිණ නැවතත් රැගෙන ගියේ ය. සමහර වේලාවල බිරිඳ කදීජා ද ගෙනැවිත් දුන්නී ය.


හිරා ගුහාව

එම අවස්ථාවේ දී මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ 40 වන වියට පා තබමින් සිටියහ. 40 වන විය සම්පූර්ණ වීමට මාස 6ක් පමණ තිබිය දී එතුමාට පැහැදිලිව සිහින පෙනෙන්නට විය. ඒවා එලෙස ම සිදු වන්නටත් විය.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට 40 වන විය සම්පූර්ණ විය. එදත්, වෙන ද මෙන් හිරාහි රැඳී සිටියහ. සවස් වරුව ගෙවී යමින් තිබුණි. හිරා හා එය අවට ප්‍රදේශය ද අඳුර වෙලාගන්නට විය.

එවිට හිරාහි තනිව ම සිටි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අසලට පැමිණි ආලෝකයෙන් ඔපවත් වූ රුවක් එතුමාණන් තරයේ වැළඳගෙන **'ඉක්රඃ'** (පවසන්න) යැයි පැවසී ය. තමා කියවීමට නොදත් බව කී විට යළිත් එම රුව **'ඉක්රඃ'** යැයි පැවසී ය. එවිටත් පෙර කී පිළිතුර ම දුන්හ. නැවතත් එම රුව තෙවන වරටත් එතුමා වැළඳගෙන **'ඉක්රඃ'** යැයි කීවේ ය. එවිටත් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් නොදත් බව කී විට, එම රුව සූරා අලක්හි මුල් ආයත් 5 පාරායනය කර පෙන්වා, එය නැවත පාරායනය කරන ලෙස පැවසී ය. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඒවා කටපාඩම් කර ගත්තේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හිරාහි සිටින විට අල්කුර්ආනය ප්‍රථමයෙන් ම පහළ වූයේ මෙලෙස ය. හිරාහි ආලෝකවත් රුවින් පෙනී සිටි ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්හට අල් කුර්ආනය ඉගැන්විය. මෙමගින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් නබිවරයකු ලෙස ප්‍රකාශයට පත්විය.

අල්ලාහ් මක්කා හා මදීනාවේ වසර 23ක් තිස්සේ අල්කුර්ආනය පහළ කළේ ය. එක විට ම පහළ නොකර අවස්ථාවට උචිත ලෙසත්, වාතාවරණයට ගැළපෙන ලෙසත් එක් වාක්‍යයක්, වාක්‍ය කිහිපයක්, සූරාවන් ලෙස අල්කුර්ආනය පහළ විය.

වහී පහළ වන එක් එක් අවස්ථාවන්හි දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ශරීරයෙහි වෙනස්කම් සිදු විය. තමා වෙත පහළ වූ වහී මනනය කර, අනතුරුව එතුමාණන් තමන් සමග සිටි තමාගේ බිරිඳන් හා සහාබාවරුන්ට එය පාරායනය කර පෙන්වා ඔවුන් ද මනනය කිරීමට යොමු කළේ ය.

ඒ සමග **'කුත්තාබුල් වහී'** නමින් වහී ලියන්නන් ලෙස පත් කළ සහාබිවරුන් කැඳවා එසැණින් ම ඒවා ලිවීමට කීහ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේ කටපාඩම් කිරීම, ලිවීම යන දෙඅංශයෙන් ම අල්කුර්ආනය තම ආරක්ෂාව ලබා ගත්තේ ය.

**අභ්‍යාස**

**කෙටි පිළිතුරු ලියන්න.**

01. ප්‍රථමයෙන් ම වහී පහළ වූ ආකාරය සටහන් කරන්න.

02. හිරා ගුහාව වැදගත් වන්නේ ඇයි?

03. මුලින් ම පහළ වූ වාක්‍යයන් අඩංගු සූරාව කුමක් ද?

04. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හිරා ගුහාවට ගියේ ඇයි?

05. ඉක්රඃ යන පදයේ අර්ථය කුමක් ද?

**පැවරුම්**

අල්කුර්ආනයේ, පළමුවෙන් ම පහළ වූ වාක්‍ය පහ අරාබි බසින් ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.